# දානය : හින්දු, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගම්වල එළඹුම

පූජ්‍ය මිරිස්වත්තේ විමලඥාණ හිමි

## ප්‍රාරම්භය

දානය හෝ (මෙම ලිපියෙහි පසුව දානය හා සමානාර්ථවත්ව භාවිත කළ හැකි යැයි යෝජනා කෙරෙන) පරිත්‍යාගය බොහෝ ආගම්වල ඇති අතිශයින් වැදගත් ආචාරාංගයකි. මෙම ලිපියෙහි දානය (හෝ පරිත්‍යාගය) ලෝකයේ බහුතරයක් ජනතාව විසින් අදහන ආගම් තුනක් වන හින්දු, ක්‍රිස්තියානි හා ඉස්ලාම් ඉගැන්වීම්වල සංකල්පීය වශයෙන් හා භාවිකාර්ථයෙන් හඳුනාගත හැකි ආකාරය සාකච්ඡාවට බඳුන් වේ. මෙම ආගම් තුනෙන් ඉපැරණිම ආගම මෙන් ම අද ලෝකයේ පවත්නා ආගම් අතුරින් පැරණිතම ආගම යැයි සලකනු ලබන්නේ හින්දු ආගම වන අතර ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගම් ඒවායේ පහළ වූ කාලයට අනුව දෙවැනි හා තුන්වැනි ස්ථානයන්ට වැටේ. ලිපියෙහි දානය සාකච්ඡාවට ලක් කර ඇත්තේ එකී ආගම් පහළ වූ කාලයට අනුව ඒවායේ පෞරාණිකත්වයට අනුවය.

ක්‍රිස්තියානි හා යුදෙවු ආගමික මූලධර්ම ඉස්ලාම් ආගමේ ආදිකර්තෘ මුහම්මද් නබි තුමන් විසින් පැහැදිලිව දැන සිටි අතර එබැවින් යුදෙවු ක්‍රිස්තියානි ආගම්වල බොහෝ සංකල්ප නිරායාශයෙන් ම නබිතුමාගේ ඉගැන්වීම්වල ඇතුළත් විය. එහෙත්, හින්දු සම්‍යාගත දානය යන වචනාර්ථයෙන් කියවෙන සදාචාරාත්මක චර්යාව ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගම්වල කවර අර්ථයකින් හඳුනා ගත හැකිද යන්න විමසා බැලිය යුතු ය. වෙනත් ආකාරයකින් පවසතොත් මෙයින් අදහස් කරන්නේ හින්දු දාන සංකල්පය ක්‍රිස්තියානි හා ඉස්ලාම් ආගම් දෙක තුළ විමර්ශනය කිරීම ශාස්ත්‍රීය වශයෙන් කෙතෙරම් නිවැරදිද යන කරුණයි. මූලික වශයෙන් ම ක්‍රිස්තියානි හා ඉස්ලාම් ඒක ඒකදේවවාදී ආගම් දෙකක් බව අප මතක තබා ගත යුතු වෙයි. සර්වබලධාරී දෙවිකෙනෙකුගේ ඉගැන්වීම් ඔහුගේ මානුෂ නියෝජිතයකු හෝ පණිවුඩකරුවකු විසින් තම අනුගාමිකයන් පිරිසකට දේශනා කිරීමෙන් අනතුරුව ස්ථාපිත වූ මෙම ආගම් වක්තෘක (Prophetic) ආගම් නමින් හැඳින්විය හැකි වෙයි. හින්දු ආගම ඒක-දේවවාදී ලක්ෂණ, බහු-දේවවාදී ලක්ෂණ මෙන් ම අදේවවාදී ලක්ෂණ ද සහිත සංකීර්ණ ආගමකි. එසේ ම, හින්දු ආගමේ ආගමික සංකල්ප සුවිශාල සාහිත්‍යයක් තුළ විසිරී පවතී. විවිධ ඍෂිවරුන්ගේ හා චින්තකයන්ගේ ඉගැන්වීම්වලින් හින්දු සමය පෝෂණය වී ඇත (Mahish, 1990: 149). වක්තෘක ආගම්වල විමුක්තිය වන්නේ යහපතෙහි හැසිරීමෙන් දෙවියන්ගේ ප්‍රසාදය දිනා ස්වකීය මරණයෙන් පසු යම් කලෙක එළඹෙන අවසාන විනිශ්චය දිනයේ (Day of Final Judgement)දී මරණයෙන් නැගී සිට දෙවියන් විසින් අත්කර දෙන ස්වර්ග රාජ්‍යයේ සදාකාලික සැපත වෙත අවතීර්ණ වීමයි (Tiwari, 1983: 163). හින්දු ආගමේ ඉගැන්වෙන විමුක්තිය දෙස අවධානය යොමු කළ කල, මූලික හින්දු පිළිගැනීම පුද්ගලයාගේ භෞතික ශරීරයෙන් ස්වාධීන වූ ආත්මන් නම් අවිනශ්වර පදාර්ථයක් ඇති බවත් එය විශ්වව්‍යාපී දිව්‍යමය මූලධාතු (ජගදාත්මන්) තත්වයක අංශුමාත්‍රයක් (ප්‍රත්‍යගාත්මන්) වන බවයි (Renou, 1951: 62). හින්දු ආගමේ විමුක්ති මාර්ග විවිධ වුවත් ආවසානික විමුක්තිය වන්නේ ආත්ම පාරිශුද්ධියෙන් ඉහත කී සර්වව්‍යාපී දිව්‍යමය ගතිය වන බ්‍රහ්මන් හා එක්වීමෙන් සදාතනික ශාන්තිය ලැබීමයි. මේ අයුරින්, ඒ ඒ ආගම්වල කේන්ද්‍රීය සංකල්ප ඒවයේ විමුක්තිය පිළිබඳ ඉගැන්වීම් හා එකඟ වෙයි. ඒ අනුව මේ ආගම් තුනෙහි දානය සමානාර්ථවත්ව හඳුනා ගත හැක්කේ කෙසේ ද යන්න විමසිය යුතු කරුණකි.

8. චූඩා-කරණ සංස්කාරය (හිසෙහි චූඩාවක් තැබීම හා සම්බන්ධ චාරිත්‍ර) 9. කර්ණවේධ සංස්කාරය (කන් විදීම හා සම්බන්ධ චාරිත්‍ර) 10. විද්‍යාරම්භ සංස්කාරය 11. උපනයන සංස්කාරය 12. වේදාරම්භ සංස්කාරය 13. ගෝදාන සංස්කාරය (පිළිසිඳගැනීම හා සම්බන්ධ චාරිත්‍ර) 14. සමාවර්තන/ ස්නාන සංස්කාරය 15. විවාහ සංස්කාරය 16. අන්ත්‍යෙෂ්ටි සංස්කාරය (මරණය හා සම්බන්ධ චාරිත්‍ර) නම් වේ (පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ, 2007: 14, 15). ඉපැරණි වෛදික යුගයේ සංස්කාරවලට අදාළ සියලු අභිචාර හෝ චාරිත්‍රධර්ම ඉටුකරන ලද්දේ ගෘහපතියා විසින් වුවත් පසුකාලීනව බ්‍රාහ්මණ ආගමික සංස්ථාව ක්‍රමානුකූලව සකස්වීමේ දී එකී කටයුතු සිදු කිරීමට බ්‍රාහ්මණ පූජකයා අත්‍යවශ්‍ය විණි. ජීවිතයේ වැදගත් සංධිස්ථා වල දී ඉටුකළ පූජා චාරිත්‍රවලදී පූජක බ්‍රාහ්මණයා දක්ෂිණාවෙන් සතුටු කිරීම ජීවිත සාඵල්‍යය සඳහා හේතු වන බව පිළිගැනිණි. දක්ෂිණාව දායකයාගේ තත්වය හා හැඟීම අනුව ආහාරපානවල සිට කෙත්වතු දක්වා විවිධ විය. කෙසේ නමුත්, දක්ෂිණාව හුදෙක් පුද්ගලික ජීවිතයේ අභිමතාර්ථ සාධනය හා සම්බන්ධ කාර්යයක් විනා එය පරහිතකාමී බව මුල් වූ චර්යාවක් ලෙස සැළකිය නොහැකිය. මෙවැනි ආගමික සන්දර්භයන්ගෙන් ඔබ්බට ගිය දානමය සංකල්ප හින්දු ආගමෙහි හමුවන නමුත් ඒවා පෘථුල පරාශයක සංවිධානාත්මකව ක්‍රියාකාරී වූ ආකාරයක් හින්දු ආගමික ඉතිහාසය තුළ පැවති බව නොපෙනේ.

## ක්‍රිස්තියානි ආගමෙහි දානය

පරිත්‍යාගය ක්‍රිස්තියානි ආගමේ හඳුනාගත හැකි ආකාරය විමසීමේ දී එම ආගමෙහි පසුබිම වූ ග්‍රීක-රෝම චින්තනයෙහි හා යුදෙව් ආගමික චින්තනයෙහි පරිත්‍යාග පිළිබඳ අදහස් ඉතා ලුහුඬින් හෝ විමසීම වැදගත් වෙයි.

ග්‍රීක-රෝම හා යුදෙව් පරිත්‍යාගශීලී භාවය පිළිබඳ චින්තනය හුදෙක් එකී ජනවර්ගයට සීමා විය. ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරයන්හි ආචාරධර්ම පිළිබඳ වැදගත් කරුණක් නම් පුද්ගලයාගේ වැදගත්කම ඔහුගේ සහජ ගුණධර්ම හා හැදියාවන් මත නොව පුරවැසියකු ලෙස ඔහුගේ තත්වය මත තීරණය කිරීමයි. ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරවල බොහෝ දෙනා වහලුන් වූ බැවින් ඔවුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ නොසළකා හරින ලදී. චිත්තවේග යටපත් කිරීමත් වේදනාව සමසිතින් දරා ගැනීමත් අභිමානවත් පෞරුෂත්ව ලක්ෂණයක් ලෙස පිළිගත් නිසා ග්‍රීක චින්තනය තුළ කාරුණිකත්වය හා දීනයන් හා දුප්පතුන් කෙරෙහි සුවිශේෂී භාවාත්මක හැඟීමක් පැවතිය යුතු බව නොසළකන ලදී. වහලුන් නොවූවත් වංශවත් හා උගත් ග්‍රීකයන් විසින් දුප්පතුන් අවඥාවට ලක්කරන ලදී. පොදු ශුභසාධනය පිළිබඳ අදහස් ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල නොපැවැති බව මේ ශිෂ්ටාචාර පිළිබඳ පවත්නා විවේචනයකි. ක්‍රිස්තුස්වහන්සේ පහළවීමට පෙර පොදු මහජනයා සඳහා ස්ථිරව ස්ථාපිත කළ රෝහලක් වත් ඇතීනාවේ හෝ රෝමයේ නොපැවැති බව කියනු ලැබේ. රෝමයේ ධනවත් මිනිස්සු මෙන් ම රෝම පාලකයෝ තමන්ගේ ගණුදෙනු කරුවන් හා යැපෙන්නන්ට සුවිශාල වශයෙන් මූල්‍යමය පරිත්‍යාග සිදු කළ ද ඒවැනි පරිත්‍යාග දුප්පතුන් අරභයා සිදු වූයේ නොවේ. එවැනි පරිත්‍යාගවල මූලික පෙළඹවීම දේශපාලනික වූවක් විය.

යුදෙව් ආගම ඊජිප්තු හා මෙසපොතේමියානු සංස්කෘතීන් විසින් බොහෝසෙයින් පෝෂණය කරන ලද්දේ නමුදු යුදෙව්වෝ දයානුකම්පාව සම්බන්ධයෙන් ග්‍රීක හා රෝම ශිෂ්ටාචාරවලට වඩා ඉදිරියෙන් සිටියහ. පැරණි ඊජිප්තු හා මෙසපොතේමියානු සංස්කෘතියෙහි පරිත්‍යාගය (charity) යන්නෙන් දෙවියන් විසින් නියම කරන ලද සමාජ සාධාරණත්වය (Constantelos, 2005: 222)අදහස් කෙරිනි. යුදෙව් ආගමෙහි පරිත්‍යාගය (charity) යුදෙව්වන් අදහස් කළ අර්ථයෙන් වෙනස් අර්ථද්වයෙක යෙදිණ. ඒ අනුව, charity යන්නෙහි හීබ්‍රෑ භාෂාවේ සමානාර්ථවත් පදය වන *aheb* යන්න මිනිසා හා ගැහැනිය අතර පවත්නා ආදරයත් ආගමික අර්ථයෙන් මිනිස් වර්ගයා කෙරෙහි දෙවියන් තුළ ත් දෙවියන් කෙරෙහි මිනිස් වර්ගයා තුළ ත් පවත්නා ආදරය කෙරිණි. මිනිසා කෙරෙහි දෙවියන් වහන්සේගේ



13 – H 044308

වූ බව හූතනා උගතුන්ගේ (Houtart, 2004: 595) විවේචනයකි. එහි සත්‍යතාවක් ඇති බව අප පිළිගත යුතුය. කෙසේ නමුත්, ලෝකයේ ආගම් විසින් කුළුගන්වන ලද පරිත්‍යාගය පිළිබඳ ඉගැන්වීම් නොවූයේ නම් ඉතිහාසයේ මිනිසාගේ තත්ත්වය අප දන්නවාට වඩා ඛේදනීය වන්නට ඉඩ තිබිණි යන්න ලේඛකයාගේ හැඟීමයි.

පාදක සටහන්

1 "කර්මේන්ද්‍රියාණි සංයම්‍ය- ය ආස්තෙ මනසා ස්මරන්- ඉන්ද්‍රියාර්ථාන් විමූඪාත්මා- මිථ්‍යාචාරඃ ස උච්‍යතෙ" (පසිඳුරන් ක්‍රියාකාරී වීමෙන් වළකාගෙන සිටින්නේ නමුදු ඉන්ද්‍රිය ගෝචර වස්තූන් සිතට නගමින් වෙසෙන තැනැත්තා තමාම රවටා ගන්නා අතර ඔහුට රැවටිලි කාරයෙකැයි කියනු ලැබේ)

2 බයිබලයේ පස්වැනි කොටස

3 ජේසුස්වහන්සේගේ අවසාන භෝජනය සමරා සිදු කරන පූජාවකි

මූලාශ්‍රය


අල්- කුර්ආන් අර්ථ විවරණය (2005) (වෙළුම I) (සිංහල පරිවර්තනය). ශ්‍රී ලංකා ජමාඅත්-ඒ-ඉස්ලාමි: කොළඹ.

යථාරූප භගවද්ගීතාව (පරි. එල්. බී. හේරත්). (1997) භක්ති වේදාන්ත ග්‍රන්ථ භාරකාර මණ්ඩලය, ලොස් ඇන්ජලීස්.

ශුද්ධ බයිබලය නව අනුවාදය (දෙවන සංස්කරණය). (1982). ශ්‍රී ලංකා බයිබල් සමාගම: කොළඹ.

පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ (2007).පුරාතන භාරතීය හින්දු සාමාජික සංස්ථා. එස්. ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ.

මවුදූදී, අබුල් ඇලා (2012).ඉස්ලාම් යනු කුමක්ද? (පරි.එස්.එම්. නවුෆර්). ශ්‍රී ලංකා ජමාඅත්-ඒ-ඉස්ලාමි: කොළඹ.

Hick, Jhon. (1989).*An Interpretation of Religion*. Yale University Presee: New Haven and London.

Masih, Y. A. (1990).*Comparative Study of Religions*. Motilal Banarsidass: Delhi.

Renou, L. (1980).*The Nature of Hinduism*, New York, 1951.

Spae, Joseph J. *Buddhist Christian Empathy*. The Chicago Institute of Theology and Culture: Chicago.

Kuruvachira, Jose. (2004).*Religious Experience: Buddhist, Christian and Hindu*. Intercultural Publications: Delhi.

Tiwari, K.D. (1983).*Comparative Religions*, Motilal Banarsidass: Pune.

Verma, K.M.P. (1982).*Philosophy of Religion*. Classical Publishing Company: Delhi.

කෙලර්, ෂොන්. (2011). "කතෝලික සමාජ දර්ශනය (පරි. ජයලත් බලගල්ල)", කතෝලික සමාජ දර්ශනය (සංස්. සිරිල් එඩේරමුල්ල). ඇස් ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ.

බලගල්ල, ජයලත්. (2011). "පළමු සියවස් පහ තුළ (ක්‍රි.ව. 500) කතෝලික සභාවේ සමාජ දර්ශනය", කතෝලික සමාජ දර්ශනය (සංස්. සිරිල් එඩේරමුල්ල). ඇස් ගොඩගේ සහ සහෝදරයෝ: කොළඹ, .

Constantelos, Demetrios J. (2005). "Charity", *The Encyclopedia of Religions* (Ed. Mercea Eliade) Vol. 3. Macmillan Publishing Company: Newyork.

Houtart, Francois. (2004). "Compassion, Love of Neighbour and Social Predicament", Encounters with God, Essays to Honour Aloysius Pieris S.J. Ecumenical Institute for Study and Dialogue, Colombo.

*A Sanskrit English Dictionary* (Ed. Monier Williams).

*Practical Sanscrit Dictionary* (Ed. Vaman Shivram Apte).

Charity and Charities අලුත් කිරීම 2014 අප්‍රේල් 16-http://www.newadvent.org/cathen/03592a.htm)

Philanthropic Perspective of Hinduism අලුත් කිරීම 2014 මැයි 20- http://learningtogive.org/faithgroups/voices/phil_persp_of_hinduism.asp